# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය - තෙවන වසර - 2017

## ව්‍යාපාර නීතිය

**පැ තුනයි (03)**

**මුළු ප්‍රශ්න සංඛ්‍යාව - 07**

<u>පළමුවන ප්‍රශ්ණය ඇතුළුව</u> ප්‍රශ්න <u>හතරකට</u> (04) පමණක් පිළිතුරු සපයන්න.

**(අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කෙරේ.)**

---

01. පහත සඳහන් ප්‍රශ්නවලට තීන්දු වූ නඩු සහ සුදුසු ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ආශ්‍රයෙන් ඔබගේ පිළිතුරට හේතු සඳහන් කරන්න.

(i) වටිනාකම Rupees Thirty Thousand වචනයෙන් සහ Rs. 13,000/= ඉලක්කමෙන් සඳහන් කරමින් සේන චෙක්පතක් අණ කරන ලදි.

ආදායකයාට තම වාසියට මෙම චෙක්පතට මුදල් ලබා ගැනීමට ඉල්ලා සිටිය හැකිද? එසේ නම් ඒ කුමන වටිනාකම සඳහා ද?

(ii) සේන රු.100,000/= කට මුදල් චෙක්පතක් ලියන ලදි. චෙක්පත අත්සන් කිරීමට පෙර සේනට දුරකථන ඇමතුමක් ලැබුන නිසා අත්සන් නොකල චෙක්පත එම ස්ථානයේ තබා පිටව යන ලදි. ඔහුගේ ලිපිකරු චෙක්පත රැගෙන "සේන" යන නමින් එය අත්සන් කර මහේෂ් වෙත ගණුදෙනු කරනු ලබන අතර ඔහු වටිනාකමක් අරභයා එම චෙක්පත භාරගන්නා ලදි. චෙක්පතෙහි "අත්සන වෙනස්" යනුවෙන් සඳහන් කර අගරු කරන ලදි.

මහේෂ්හට යම් අයිතිවාසිකම් ලැබේද?

(iii) කොළඹ සිටින මහේෂ්ට නුවරඑළියේ සේන BOP ෆානිංග්ස් වර්ගයේ තේ කිලෝග්‍රෑම් 1000 ක් අලෙවි කරන ලදි.

මහේෂ් වෙත භාණ්ඩ ලැබීමට පෙර හා පරීක්ෂා කිරීමට පෙර උප-ගැණුම්කරුවන් හතර දෙනෙකුට එම භාණ්ඩ අලෙවි කරන ලදි.

කොළඹට භාණ්ඩ ලැබුණ විට මහේෂ්ට දැන ගන්නට ලැබුණේ ඒවා BOP ෆානිංග්ස් වර්ගයේ තේ නොවන නමුත් බාල වර්ගයේ කසල තේ බවයි.

(iv) සේන මහේෂ් වෙත මිදි කිලෝ ග්‍රෑම් 1000 ක් අලෙවි කරන ලද අතර ඔහු ඒවායේ වටිනාකම සඳහා චෙක් පතක් භාර දෙන ලදි. චෙක්පත්‍රය අගරු විය. භාණ්ඩ තවමත් සේනගේ භාරයේ පවතී.

සේනට තිබෙන සහන මොනවාද?

(v) නවුෆර් නැමති සෞදි අරාබියේ සිටින ධනවත් ව්‍යාපාරිකයෙකු කටාර් රාජ්‍ය ඇතුලු තවත් රටවලට ආහාර නිෂ්පාදිත අපනයනය කරනු ලබයි. කටාර්හි ඔහුගේ ව්‍යාපාර බලා ගැනීම සඳහා ෆවුසි තම නියෝජිතයා ලෙස පත් කරන ලදි. මේ සඳහා ෆවුසි විසින් කටාර් රාජ්‍ය තුළ බොහෝ ගිවිසුම්වලට එළැඹෙන ලදි. මෑතකදී සෞදි අරාබියානු ආණ්ඩුව කටාර් රාජ්‍ය සමග ඇති සියලු තානාපති සබඳතා අවසන් කරන ලදි.

නවුෆර් වෙනුවෙන් ෆවුසි විසින් එළැඹෙන ලද ගිවිසුම්වලට කුමක් සිදුවේද?

02. භාණ්ඩ විකිණීමේ ආඥාපනත මගින් භාණ්ඩවල අයිතිය විකුණුම්කරු වෙතින් ගැණුම්කරු වෙත මාරුවීම පිළිබඳව වඩාත් අවධානයක් යොමු කර තිබේ.

භාණ්ඩවල අයිතිය මාරුවීම පිටුපස තිබෙන පරමාර්ථවල වැදගත්කම කුමක්ද?

භාණ්ඩවල අයිතිය මාරුවීම හුදු න්‍යායක් ලෙස පමණක් වැදගත් නොවන අතර භාවිතයේදී ද වැදගත් කාර්යයක් සිදු කරන බව ඔබ සිතන්නේ ද?

නඩු තීන්දු හා අදාළ ප්‍රතිපාදන සඳහන් කරමින් ඔබගේ පිළිතුරට ඇති හේතුන් පිළිබඳව විවේචනාත්මකව ඇගයීමක් ලබා දෙන්න.

03. හුවමාරු ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ආශ්‍රයෙන් පහත ප්‍රශ්න සඳහා ඔබගේ පිළිතුරට හේතු ලබා දෙන්න.

(i) A විසින් C ගේ වාසියට B වෙත බිලක් අණ කරන ලදි. B විසින් බිල ප්‍රතිග්‍රහණය කල පසු D වෙත ගණුදෙනු කරන ලදි. පසුව ඔහු එම බිල B වෙත ගණුදෙනු කරන ලදි.

බිලෙහි නීතිමය තත්ත්වය කුමක්ද?

(ii) නියමිත පරිදි ලියන ලද බිලක් එය ලියූ දින පටන් මාස තුනක් ගත වූ පසුත් ගෙවීම සඳහා ඉදිරිපත් කර නොමැත. එවැනි බිලක ආදායකයා වෙත එම බිල සඳහා යම් අයිතිවාසිකමක් ලැබෙයි ද?

(iii) බිලක ආදායකයා "2016 ඔක්තෝම්බර් මස පළමුවන දිනට යෙදෙන x ගේ උපන් දිනයේදී ඔහුට ගෙවනු" යන වචන සඳහන් කර පිටසන් කරනු ලබයි. X විසින් බිල්පත සඳහා ගෙවීම ලබා ගැනීමට 2016 සැප්තැම්බර් මස 20 වන දින ඉදිරිපත් කරන ලද අතර එයට ගෙවීම කරන ලදි. සාකච්ඡා කරන්න.

04. මොහාන් සහෝදරයන්ගේ වාසියට ටෝකියෝ බැංකුව වෙත රු.75,000/= ක චෙක්පත් රාජා විසින් අණ කරන ලදි.

පහත සඳහන් අවස්ථාවන් අවධාරණය කරමින් තීන්දු වූ නඩු ඇසුරෙන් සහ අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සඳහන් කරමින් ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

(i) මොහාන් සහෝදරයන්හි සේවයේ නියුතු අරුණී නමැති ලිපිකාරිනය එක් හවුල්කරුවකුගේ අත්සන ව්‍යාජ ලෙස පිටසන් කර චෙක් පත සඳහා මුදල් ලබා ගන්නා ලදී.

(ii) හෙන්රිගේ වාසියට මොහාන් සහෝදරයන් විසින් චෙක්පතක් අණ කරන ලද අතර ඔහු එය වටිනාකමක් සඳහා භාර ගන්නා ලදි. හෙන්රි අතින් චෙක්පත අස්ථානගත වූ අතර සංජයට චෙක්පත් හමු විය. මැඩ්රාස් බැංකුවෙහි ගිණුමක් ඇති සංජය වෙත එම ගිණුම මගින් චෙක්පත සඳහා මුදල් ගෙවන ලදි. මැඩ්රාස් බැංකුව හෙන්රි වෙත වගකීමට බැඳේද?

05. (i) ඇමෙරිකානු ඩොලර් 25,000/= ක මි.ර.ගැ. (C.I.F.) ලන්ඩන් වටිනාකමට මහා බ්‍රිතාන්‍යයේ සිටින පැට්‍රික්ට කොළඹ සිටින සරත් විසින් ක්‍රේප් රබර් තැටි 5000 ක් අලෙවි කරන ලදි. සරත් රබර් තැටි කොළඹ වරාය වෙත ප්‍රවාහනය කරන ලද අතර ඒවා ප්‍රවාහනය සඳහා LL Martin නැමැති නැව පැට්‍රික් විසින් නම් කර ඇත. ගණනයේදී සිදු වූ දෝෂයක් නිසා රබර් තැටි 4992 ක් පමණක් පටවන ලදි. කෙසේ නමුත් නෞභාර පත්‍රයෙහි පෙන්නුම් කරන ලද්දේ ක්‍රේප් රබර් තැටි 5000 ක ප්‍රමාණයකි.

සරත් නෞභාර පත්‍රය අත්සන් කරන ලද්දේ පැට්‍රික් වෙත භාණ්ඩවල සම්පූර්ණ වටිනාකම හුවමාරු කිරීම යනුවෙනි. LL Martin නැමැති නැව ලන්ඩන් වෙත ළඟා වූ පසු ප්‍රමාණයෙහි තිබූ දෝෂය අනාවරණය කර ගන්නා ලද අතර පැට්‍රික්

විසින් නැවට එරෙහිව නඩු පැවරුවේ අස්ථානගත වූ රබර් තැටිවල වටිනාකම අය කර ගැනීම වෙනුවෙනි.

නඩු තීන්දු හා අවශ්‍ය නීති මූලධර්ම ඇසුරින් LL. Martin නැව් හිමියන්ට උපදෙස් දෙන්න.

(ii) ඉහත වාතාවරණය යටතේ, LL Martin නැමැති නැව කොළඹ වරායේ සිට ලන්ඩන් දක්වා ඉන්දියන් සාගරයෙහි භාණ්ඩ ප්‍රවාහනය කරමින් සිටින අතර තුර නැව රළු මුහුදට හසුවීමෙන් නැව තුළට මුහුදු ජලය ඇතුළුවීමෙන් රබර් තැටි ගබඩා කර තිබූ කන්ටේනරය සමග මිශ්‍ර වී ඇත. නැව ලන්ඩන් වරායට ළඟා වූ විට ගැණුම්කරුට සොයාගත හැකි වූයේ කන්ටේනරය තුළට මුහුදු ජලය ඇතුළු වීම නියමිත භාණ්ඩවලින් සමහර කොටස්වලට හානි සිදු වී ඇති බවය.

අදාළ නඩු තීන්දු සහ 1982 මුහුදින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ පනත සහ සංශෝධිත 1968 හේග් විස්බි (Hague Visby) රීතීන් හි ඇති අදාළ නීතිමය ප්‍රතිපාදන මගින් ගැණුම්කරුට උපදෙස් දෙන්න.

06. නීතිඥවරයකු විසින් බලයක් නොමැතිව පැමිණිලිකරුගේ නමින් නෛතික කාර්යයක් ආරම්භ කිරීම නීතියෙන් පිළිගෙන ඇත. නීතිඥවරයාගේ ක්‍රියාව පැමිණිලිකරුට අපරාණුමත කල හැකි අතර එකී කාර්යයද අනුගමනය කල හැක. එවන් අවස්ථාවකදී ප්‍රධානියා සහ නියෝජිතයා අතර පවතින සාමාන්‍ය නීතිය සහ සාමාන්‍ය අපරාණුමත න්‍යාය අනුව මුලින් ආරම්භ කරන ලද කාර්ය පටිපාටියෙහි ඇති අඩුපාඩු ද මේ නිසා සමනය වේ.

එයට හේතුව වන්නේ ඉංග්‍රීසි නීතියෙහි අපරාණුමත කිරිම අදාළ වන්නේ නියෝජිතයාගේ බල රහිත ක්‍රියාව පසුපසට ගොස් නැවත අනුමත කිරීමයි.

Per Dillion LJ in Presentactiones Musicales SA v Secunda [1994] 2 All ER 737, (1994) (h 271)

ඉහත ප්‍රකාශණය අපරාණුමත කිරීම පිළිබඳ මූලධර්මය සහ නියෝජ්‍යත්ව නීතියෙහි සාමාන්‍යයෙන් භාවිත වන කොන්දේසීන් යටතේ අවධානය යොමු කරන්න. අදාළ නඩු තීන්දු ඔබගේ පිළිතුර මගින් අවධාරණය කරන්න.

07. කෙටි නිවාඩුවක් ගත කිරීම සඳහා ඕස්ට්‍රේලියාවේ වාසය කරන ශ්‍රී ලංකා ක්‍රිකට් රසිකයකු වන සන්දීප් ශ්‍රී ලංකාවට පැමිණියේය.

ඔහු රු.100,000/= කට අඟල් 24 දුරස්ථ පාලක වර්ණ රූපවාහිනියක් සහ ගෘහස්ථ සිනමා වීඩියෝවක් (Home theater video) ඉලෙක්ට්‍රෝනික උපකරණ අලෙවිකරන කොළඹ 12 සීමාසහිත ඩැනී සහ සමාගම (ඩැනී) වෙතින් මිලට ගත්තේය. ඔහුගේ වීසා ණය පත (Visa Card) භාවිත කරමින් ඒ සඳහා මිල ගෙවන ලදි.

පහත සඳහන් අවස්ථාවන්හිදී සන්දීප් ගේ අයිතිවාසිකම් කවරේද? තීන්දු වූ නඩු, අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ අදාළ මූලධර්ම ඔබගේ පිළිතුර මගින් උපුටා දැක්වීම අවශ්‍ය වේ.

(i) මිලදී ගැනීමෙන් දිනකින් පසු සන්දීප් රූපවාහිනිය බලමින් සිටින අතරතුර රූපවාහිනිය පිටුපසින් ක්ෂණික දීප්තියක් සහ දුමාරයක් පිටවීමෙන් තිරය නොපෙනී ගියේය. සන්දීප්ට මේ නිසා හුස්ම ගැනීමේ අපහසුතාවයන් ඇති වූ අතර මෙම සිද්ධියෙන් පසු එකිනෙහිම ඔහු කොළඹ රෝහලට ඇතුළු කරන ලදි.

(ii) සන්දීප් රූපවාහිනිය මිලට ගත්තේ සමාගමේ විස්තර පොත (Catalog) කියවා බැලීමෙන් පසුවයි. එහි විස්තර කරන ලද්දේ එය අඟල් 24 වර්ණ රූපවාහිනියක් බවය. තවද එම සමාගමෙහි අලෙවි කළමනාකරු ඔහුට ප්‍රදර්ශණාගාරයේ ප්‍රදර්ශණයට තබන ලද සාම්පලයක් පෙන්වීමෙන් පසුව ඔහු එය මිලට ගන්නා ලදි.

ඔහු එය භාවිත කිරීම ආරම්භ කිරීමෙන් පසු ඔහුට සොයා ගැනීමට හැකි වූයේ එය කළු-සුදු රූපවාහිනියක් බවත් එමෙන්ම වර්ණ රූපවාහිනියක් නොවන බවත්ය.

(iii) සන්දීප් රූපවාහිනිය නරඹමින් සිටින අතරතුර මරදාන පොලිස් ස්ථානාධිපති සෝදිසි වරෙන්තුවක් ද අතැතිව ඔහුට ප්‍රකාශ කරන ලද්දේ මෙහි නියම හිමිකරු විමල් සහ පුත්‍රයෝ බවය. පොලිසිය එම රූපවාහිනිය සොරකම් කරන ලද භාණ්ඩ බව ප්‍රකාශ කරමින් එය තහනමට ගන්නා ලදි.

○•○•○•○•○•○•○•